මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

---

මාධ්‍ය නිවේදන අංක : **15/2024** **2024.10.25**

## සම්මානයෙන් පිදුම් ලැබූ මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ ඉ සේවාව

මෙරට ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල වන බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි (BCS) ශ්‍රී ලංකා අංශය මඟින් 26 වන වරට සංවිධානය කරන ලද ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන - 2024 ( National ICT Awards – NBQSA 2024 ) සම්මාන උළෙල 2024.10.23 වන දින ශ්‍රී ජයවර්ධනපුර Monarch Imperial හි පැවති අතර එහිදී රාජ්‍ය අංශයේ සංවිධානයක් වෙත එම රාජ්‍ය ආයතනය මඟින් එහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිසරය සකස් කිරීම, පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම වෙනුවෙන් සිදුකරන ලද අසමසම සේවාවන් වෙනුවෙන් පිරිනැමෙන Public Sector Most Outstanding ICT Achievement Award යටතේ වන ඉහළම සම්මානය මැතිවරණ කොමිෂන් සභාව මඟින් හඳුන්වා දෙන ලද මැතිවරණ ඉ සේවාව සඳහා පිරිනමන ලදී.

එමෙන්ම මහජනතාව සඳහා වැඩිදියුණු කළ රාජ්‍ය සේවාවන් සැපයීම හෝ මහජන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා වන ඩිජිටල් මුලපිරීම සඳහා කැප වූ අසමසම තොරතුරු තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන Digital Government in Public Sector and Government අංශය යටතේ පිරිනමන ලද ඉහළම සම්මානය ලෙස රිදී සම්මානය ද මෙම සම්මාන ප්‍රධානෝත්සවයේ දී මැතිවරණ ඉ සේවාව වෙත පිරිනමන ලදී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්